**ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය - 268 කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 210.60 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 206.84 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.76 ක් හෙවත් සියයට 1.78 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 173.60 | 170.57 | 3.03 | 1.74 |
| මූලධන | 37.00 | 36.27 | 0.73 | 1.98 |
| **එකතුව** | **210.60** | **206.84** | **3.76** | **1.78** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 17 ක් හා දෙපාර්තමේන්තු 14 ක් විසින් එකතුව රු.මිලියන 374.10 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 340.35 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 33.75 ක් හෙවත් සියයට 9.02 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 13.38 | 6.88 | 8.38 | 9.87 | 47.00 | 37.34 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 7002/0000/00/0286/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 24.35 ක් වී තිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 31,277,944 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0116/000 | 50,000 |
| 6000/0000/00/0013/0076/000 | 537,946 |
| 6000/0000/00/0016/0064/000 | 15,274,909 |
| 6000/0000/00/0017/0019/000 | 5,151,030 |
| 6000/0000/00/0018/0076/000 | 1,726,900 |
| 6003/0000/00/0020/0010/000 | 8,537,159 |
| **එකතුව** | **31,277,944** |

## 2.5 විගණන නිරීක්ෂණය

-----------------------

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-------------------------------------------------

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 මාර්තු 31 දිනට ඉදිරිපත් කළ යුතු ආදායම් ගිණුම් 2016 ඔක්තෝබර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ---------------- | ------------------ | ------------ |
| (i) | පොත් නාමාවලිය | 5:9 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත | පවත්වා නොතිබුණි |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලින කර නොතිබුණි. |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛණය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| (iv) | දුරකථන ලේඛණය | මුදල් රෙගුලාසි 846(3) හා 845(1) | පවත්වා නොතිබුණි |
| (v) | ප්‍රසම්පාදන කාල සටහන | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (vi) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| (vii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |

### 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 04ක් සඳහා සලසා තිබුණු මුල් ප්‍රතිපාදනය රු.16,800,000 ක් සියයට 10 සිට සියයට 25 ක් දකවා අවස්ථා 06 කදි අඩුකර තිබුණු අතර තවත් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සියයට 8.3 සිට සියයට 40 ක් දක්වා වැඩිකර තිබුණි. නිසි මූල්‍ය පාලන සැලසුමකින් තොරව අයවැය ඇස්තමේන්තුව පිළියළ කර තිබුණු බව මේ අනුව නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයක රු. 110,448 ක් හෙවත් සියයට 14 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වීම් මාරු කිරීම් සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

### 3.4 අග්‍රිම ගිණුම

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොත්වල පිළිවෙලින් රු.13,494,230 ක හා රු.1,002,100 ක නිරවුල් නොකළ අග්‍රිම 2015 දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කර්මාන්ත ආරම්භ කර හෝ අවසන්ව නොමැති කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු වෙත රු.14,496,330 ක චෙක්පත් 09 ක් ලියා තිබුණු අතර, මෙම අග්‍රිම භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකර බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස 2016 සැප්තැම්බර් 30 දින සිට මාස 09 කට වැඩි කාලයක සිට රඳවා ගෙන තිබුණි.

### 3.5 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.
පොදු තැන්පත් ගිණුමේ මාස 24 සිට මාස 28 ක් දක්වා වූ කාල පරාසයක් රඳවාගෙන තිබූ රඳවා ගැනීමේ තැන්පතු 15 කට අදාල එකතුව රු.380,957 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 26801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සේවය හැරගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.649,195 ක හිඟහිටි ණය ශේෂ ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ 4 වගන්තිය ප්‍රකාරව හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 500(1) ට පටහැනිව අග්‍රිම ලබාගැනීමකින් තොරව ණය හා අත්තිකාරම් වශයෙන් රු.649,550 ක මුදලක් කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

**(ආ) වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් කිලිනොච්චි වෙත ලබාදුන් රු.281,679 ක් වටිනා විද්‍යුත් හා පරිගණක අයිතමයක් පැවතියදී, එවැනිම අයිතමයන් සමාලෝචිත වර්ෂයේදී රු.124,290 ක මුදලකට මිලදී ගැනීම විගණනයට සාධාරණීකරණය කළ නොහැකි විය.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂාවේදී නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94(2) | 811,437 | බැරකම් 57 ක් වෙනුවෙන් ස්වාධීන සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 115 | 4,600,165 | කන්දවලායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී සිදුවූ ගං වතුර ආපදා සහනාධාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සිදුකළ ගෙවීම් 20 ක් වෙනුවෙන් මාස 04 සිට මාස 07 ක් දක්වා කාලයක් ගතවී තිබුණද, මෙම ගෙවීම් සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා මඟින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 504(1) | 37,342,597 | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ කාර්තුමය වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී පොදු තැන්පත් ගිණුම තුලනය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. |

(ආ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංගහය**

| | | |
|---|---|---|
| 8.13.4 මාර්ගෝපදේශය | 1,470,027 | කනගාපුරම් ආර්ථික මධ්‍යස්ථානයෙන් අභ්‍යන්තර පිවිසුම් මාර්ගය ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව අසම්භාව්‍යයන් සඳහා වූ ඇස්තමේන්තුවේ සියයට 25 ක විචලනයන් අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සමාලෝචිත වර්ෂයේදී අනුමත කර නොතිබුණි. |

## 3.9 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, හා ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරික්ෂාවේදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(i) 2015 දෙසැම්බර් මාසයේ අවසාන සතියේ ලියන ලද කොන්ත්‍රාත් වැඩ 03 කට අදාල වටිනාකම රු.8,139,200 ක චෙක්පත් 05 අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත නිකුත් කිරීමකින් තොරව අත රඳවා ගෙන තිබුණි. තවද, අදාල වැඩ ආරම්භ කිරීමට හෝ නිම කිරීමට 2016 ඔක්තෝබර් 25 දින වන විටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) කනගාපුරම් ආර්ථික මධ්‍යස්ථානයට පිවිසීමේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු වෙළඳ පොළ මිල සැදැහුම් ක්‍රමය (Shopping Procurement Method ) යටතේ රු.5,943,336 ක වටිනාකමට කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණද, බොරළු යෙදීම මෙන්ම මාර්ගයේ සුමට බවද ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමිතියට නොවූ අතර තණකොළ ද වැවී තිබුණු බව විගණන පරික්ෂාවේදී නිරික්ෂණය විය. ජාතික තරඟකාරී මිල කැඳවීමකට අවතීර්ණ නොවීමට හේතු සහ වැඩට අදාල ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ විස්තර මෙන්ම නියමිත වේලාවේදී ලැබී තිබුණු ලංසු පිළිබඳ විස්තරයක්ද විගණනයට ඉදිරිපත් නොවිය. කෙසේ වුවද, ආර්ථික මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත් පිරිවැය මෙන්ම එය

මහජනතාවට ප්‍රයෝජනවත්වීම සඳහා මෙතෙක් විවෘත නොවීම පිළිබඳ හේතු 2016 ඔක්තෝබර් 25 දින වන වටිත් විගණනයට ඉදිරිපත් නොවීය.

### 3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කන්දවලායි ප්‍රාදේශීය ලේකම කාර්යාලයට අවස්ථා 9 කදී පිසූ ආහාර සැපයීම වෙනුවෙන් ඉදිරිපත් වූ ඉන්වොයිසි හා ගෙවීම් වවුචර් අතර රු.215,233 ක වෙනසක් නිරික්ෂණය විය. කෙසේ වුවද, මෙම වෙනසට හේතු විගණනයට පැහැදිළි නොකෙරුණි.

(ආ) 2014 වර්ෂයේදී ගංවතුරෙන් අවතැන්වූ ජනතාවට භාණ්ඩ සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 138(3) ට පටහැනිව එම සැපයුම්කරුවන්ගේ නමින් මුදල් නොගෙවා ග්‍රාම නිලධාරීන් 5 දෙනෙකුගේ නම් වලින් එකතුව රු.1,936,840 ක් වටිනාකම වූ චෙක්පත් 12 කින් කන්දවලායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් සිදුකර තිබුණි.

### 3.11 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු

-------------------------------------

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

2014 වර්ෂයේදී  ගංවතුරෙන් ආපදාවට ලක්වූ ජනතාව 2014 දෙසැම්බර් 04 දින සිට දින 10 ක් දක්වා වූ කාලපරිච්ඡේදයක් සුභ සාධන මධ්‍යස්ථාන 8 කදී නවාතැන් පහසුකම් සැලසූ අතර ඔවුන්ට විවිධ අයිතමයන් සැපයීම වෙනුවෙන් රු.1,364,985 ක් ගෙවා ඇති අතර මේ සඳහා 2011 ජුනි 14 දිනැති අංක 152 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### 3.12 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරික්ෂාවේදී  අනාවරණය වූ කළමනාකරණ දුර්වලතාවයන් සම්බන්ධයෙන් ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කරච්චි කොට්ඨාශයේ ගර්භනී මව්වරුන්ට ලබාදුන් රු.2,192,000 ක් වටිනා පෝෂණ කූපන්පත් ඒවා බෙදා හරිනු ලැබූ අවස්ථාවේදීම අවලංගු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.1,420,758 ක් එකතු කළ අගය මත බදු (VAT) වශයෙන් කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබුණද, බදු ඉන්වොයිස් පත් සහ VAT ලියාපදිංචියෙහි වලංගුතාවය පිළිබඳ සහතික පරික්ෂාවක් සිදුකර නොතිබුණි.

### 3.13 වැඩියෙන් ගෙවීම්

--------------------

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

කන්දවලායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය සමඟ රු.මිලියන 13.475 ක වටිනාකමට 2014 ජූලි 03 දින ගිවිසුමකට එළඹ තිබූ අතර උපදේශක සේවා සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙත රු.මිලියන 1.288 ක මුදලක් ගෙවීම වෙනුවට කාර්යාංශය වෙත රු.මිලියන 3.755 ක

මුදලක් ගෙවීම් කර තිබුණි. මේ අනුව, රු.මිලියන 2.487 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.14 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ හේතූන් මත ඇතිවූ රු.72,963,466 ක පාඩු විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. වර්ෂ 7 කට වැඩි කාලයක සිට පැවත එන මෙම මුදල හඳුනාගෙන එය නිරවුල් කිරීමට මෙතෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වසර 7 කට වැඩි කාලයක සිට පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 4 ක වටිනාකම් තක්සේරු කර විසර්ජන ගිණුමට ගෙන නොතිබුණි.

**3.15 විසඳා නොතිබුණු විගණන ජේද**

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව 2014 අප්‍රේල් 08 දින පැවති 197 වැනි රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදි ගනු ලැබූ තීරණවල පසු විපරම් කටයුතු නිමකර නොතිබුණු ජේදවලට යොමුව පහත දැක්වේ.

| කාරක සභා රැස්වීම් තීරණවලට යොමුව | | යොමුගත විෂයය |
| --- | --- | --- |
| වර්ෂය | ජේද අංකය | |
| 2014 | 10 (iv) | වී මිලදී ගැනීම සඳහා සමුපකාර සමිති 4 කට ලබාදුන් රු.7,200,000 ක අත්තිකාරම් මුදල් නිරවුල් නොකිරීම පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග වසර 2 කට අධික කාලයක සිට නොගැන ප්‍රමාද කිරීම. |
| 2014 | 10(v) | තාවකාලික මාර්ග බලපත්‍ර නිකුත් කිරීම මගින් රැස්කරනු ලැබූ රු.6,631,171 ක් 2014 අප්‍රේල් 08 දිනැති රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විමසන අවස්ථාවේදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල පොදු තැන්පත් ගිණුමේ පැවති අතර 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 1,726,900 ක ශේෂයක් පොදු තැන්පත් ගිණුමේ දක්නට ලැබුණි.කෙසේ වුවද, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව මෙම රැස්කිරීමේ මුදල උපයෝගි කරගෙන පුද්ගලික බස් නැවතුම්පළක් ඉදිකිරීමට සැලැසුම් කර ඇති බව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත දිස්ත්‍රික් ලේකම්වරයා විසින් දන්වා සිටියත් වර්ෂ 02ක් ඉක්මවා ගොස් තිබුණද එම කාර්යය ඉටුකිරීම සඳහා මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

**3.16** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**--------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 14 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 14 | 1 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 341 | 223 | 118 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 99 | 52 | 47 |
| | **එකතුව** | **477** | **290** | **187** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පුරප්පාඩු 187 ක් සම්පූර්ණ කිරීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.